# රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම
## (ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරිනි)

ඩී.එච්. සසිකා මධුවන්ති[1]

**සංක්ෂේපය**

පාසල් ළමුන් විසින් රූපවාහිනිය නැරඹීමෙන් ඔවුන්ගේ අධ්‍යාපනයට හා චර්යාවට හිතකර මෙන්ම අහිතකර ප්‍රතිඵල රැසක් ඇතිවිය හැකි බැව් මෑත කාලීනව සිදුකරන ලද පර්යේෂණ මඟින් තහවුරු කර ඇත. ධන සහ ඍණ බලපෑම පිළිබඳව තවමත් ශ්‍රී ලාංකික සමාජය තුළ වාද විවාද පවතී. එබැවින් රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇතිකරන බලපෑම කෙබඳු ද යන්න අධ්‍යන ගැටළුව ලෙස යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇති කරනු ලබන තර්ජනාත්මක බලපෑම හඳුනාගනිමින් ඒ සඳහා බලපාන සාධකවල ප්‍රමාණාත්මකතාව තීරණය කිරීම අධ්‍යයනයේ අරමුණයි. අධ්‍යයනය සඳහා ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තොරාගත් අතර සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ පාසල් සිසුන් 200 දෙනෙකු අධ්‍යයනයට භාජනය කරන ලදී. සම්මුඛ සාකච්චා සහ ප්‍රශ්නාවලි ක්‍රමය උපයෝගී කර ගනිමින් ප්‍රාථමික දත්ත ලබා ගත් අතර සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රමයන් උපයෝගී කර ගනිමින් දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. ඒ අනුව නියැදියෙන් 98% පමණ රූපවාහිනිය නරඹන අතර, දිනකට පැය 2-6 ත් අතර කාලයක් රූපවාහිනිය නැරඹීම සිදු කරනු ලබන බව අනාවරණය විය. එමෙන් ම ප්‍රචණ්ඩකාරී වැඩසටහන් නැරඹීමේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස්කම් පවතින අතර හරාත්මක වැඩසටහන් නැරඹීමේ ඌණතාවයක් දක්වන බවත් විදේශීය ටෙලිනාට්‍ය සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වන බවත් තහවුරු විය. තව ද විකාශය වන වෙළෙඳ දැන්වීම් සහ ළමුන්ගේ ක්ෂණික ආහාර රුචිකත්වය අතර ධන සම්බන්ධතාවයක් ඇති බවත් හෙළි විය. දෙමාපියන් රැකියාවල නිරතව සිටින හා සෙල්ලම් කිරීමට ගෙවත්තක් නොමැති නාගරික ළමුන් වැඩි වශයෙන් රූපවාහිනී නරඹන බවට ආනාවරණය විය. ළමුන් බහුලව රූපවාහිනිය නරඹන කාල සීමාවන් තුළ අධ්‍යාපනික හා හරාත්මක වැඩසටහන් විකාශනය කිරීමටත් ටෙලිනාට්‍ය, කාටූන්, චිත්‍රපට, ප්‍රචණ්ඩකාරී ආදී වැඩසටහන් කිසියම් ප්‍රමිතිකරණයක් යටතේ විකාශනය කිරීමත් මඟින් රූපවාහිනී වැඩසටහන් මඟින් ළමුන් කෙරෙහි ඇති කරන ඍණාත්මක බලපෑම අවම කල හැකි බව මෙම අධ්‍යයනය මඟින් තවදුරටත් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** *රූපවාහිනී වැඩසටහන්, ඍණ බලපෑම, හරාත්මක වැඩසටහන්, සංඛ්‍යාත්මක විශ්ලේෂණ*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය , කැලණිය විශ්වවිද්‍යාලය
shachmadhuwanthi@gmail.com